www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොලඹ සහ මහනුවර රැස්වීම්වලින් පසු ශ්‍රී ලාංකිකයෝ ඉරාක යුද්ධය, එක්සත් ජනපද ජනාධිපතිවරනය සහ ජාත්‍යන්තරවාදය පිලිබඳව අදහස් දක්වති

**Following the SEP meetings in Colombo and Kandy**
**Sri Lankans speak about the Iraq war, the US election and internationalism**

**අපේ වාර්තාකරුවන් විසිනි**
**2004 ඔක්තෝබර් 28**

එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ජනාධිපති අපේක්ෂක බිල් වැන් ඕකන් ශ්‍රී ලංකාවේ රැස්වීම් දෙකක් ඇමතීමෙන් අනතුරුව එයට සහභාගිවූවන් අතර උද්යෝගිමත් සාකච්ඡාවක් දැල්විනි. දේශන නිමාවත්ම එයට සවන් දුන් ඇතැමුන් වැන් ඕකන් වටා රොක්වූ අතර ඇතැමුන් සසප සාමාජිකයන් හා තම අදහස් හුවමාරු කර ගනු වස් සාහිත්‍ය මේසය අසලට රැස් විය. තවත් සමහරුන් දේශන පිලිබඳව ඔවුනොවුන් අතර කතා බහේ නිරත විය. සිංහලෙන්, දෙමලෙන් සහ ඉංග්‍රිසියෙන් පැවැත්වුනු මෙම සාකච්ඡා අවසානයේ දී නිමාවට පත් වූයේ දේශන ශාලා දොරගුලු ලැමෙන් අනතුරුව ය.

පැමින සිටි බොහෝ දෙනෙකුට එක්සත් ජනපදයේ දේශපාලන තත්වය පිලිබඳ විස්තර සහ ඇමරිකානු කම්කරු පන්තිය මුහුන දී සිටින කොන්දේසි නව අනාවරනයක් විය. නමුදු බොහෝ අදහස් පල වූයේ රැස්වීමේ ස්වභාවයෙන් පවා පෙන්නුම් කෙරුනු හා දේශනයෙන් ඉදිරිපත් කෙරුනු ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනය සම්බන්ධයෙනි. වාර්ගික ලේ ගැලීම්වලින් සහ යුද්ධයෙන් ඉරිතැලුනු රටක මෙම අදහස් සිත් කා වදින ස්වර සංඝාතයකි. පේරාදෙනිය සරසවියේ පැවති දේශනයෙන් අනතුරුව වැන් ඕකන් වෙත පැමිනි එක් කාන්තාවක කියා සිටි අයුරු ''අපට මෙහි අවශ්‍යව ඇත්තේ මෙයයි, එනම් ජාත්‍යන්තරවාදයයි''.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වාර්තාකරුවන් විසින් දේශනවලට සහභාගි වූවන් ගේ අදහස් විමසන ලදී.

පිලියන්දල සිට පැමිනි **චානක** නම් තරුන ශිෂ්‍යයකු විස්තර කලේ මෙසේ ය: ''ඇමරිකාව ගැන මහ ලොකු අදහස් මට තිබුනෙ. මගේ මිතුරන්ටත් එහෙමයි. අපි හිතුවෙ එහේ මිනිස්සුන්ට ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනව කියලත් සෞභාග්‍යමත් ජීවිත ගත කරනව කියලත්. අද මම දැන ගත්ත ඒක එහෙම නොවෙයි කියල. එහෙම ප්‍රජාතන්ත්‍රවාදයක් එහෙ නෑ. ඒ වගේම එහේ මිනිස්සු වඩාත් දුප්පත් වෙමින් පවතිනවා''.

''කෙරී ගැනත් අපි හිතාගෙන හිටියෙ එහෙමයි. කෙරී ඇත්ත වසයෙන්ම බුෂ් ට එරෙහි වෙනව කියලයි අපි හිතුවෙ. මං හිතන්නෙ මේ ඔක්කෙම වැරදි අදහස් නිර්මානය කරන්නෙ මාධ්‍යයන් විසින් කියලයි. මං ඉගෙන ගත්ත එක්සත් ජනපදය තුල ද්වි-පක්ෂ ක්‍රමය, පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා වැඩ කරන්නෙ කොහොමද කියල. ශ්‍රී ලංකාවෙත් මේකම තමයි වෙන්නෙ. එක පාරකට එක්සත් ජාතික පෙරමුන (එජාපෙ), අනෙක් පාර මේ ආන්ඩුව (එක්සත් ජනතා නිදහස් සන්ධානය).

''අපි ඉරාකය පිලිබඳ යමක් මාධ්‍යවලින් දැන ගත්තට ඒවා වැදගත් නෑ. අද දේශනය ඇහුවට පස්සෙ එක්සත් ජනපදය මේ යුද්ධය දියත් කලේ ඇයි ද යන්න සම්බන්ධයෙන් වඩාත් හොඳ අවබෝධයක් ලබාගන්න මට හැකි වුනා. මේ යුද්දෙ ඔවුන්ගේ අවශ්‍යතාවන් සඳහා''.

කොලඹ සිට පැමිනි **තරුන පාසල් සිසුවෙක්**: ''ශ්‍රවනාගාරයෙ වාඩිවෙලා ඉන්න කොට මට ගැඹුරින්ම දැනුන දේ තමයි, ජීවිතයෙ පලමු වතාවට නියම ජාත්‍යන්තරවාදී කම්කරු පන්තික සිද්ධියකට මම සහභාගිවෙමින් සිටින බව. මට වගේම අනෙක් අයටත් එහෙම දැනෙනව ඇති කියල මම හිතුව. කිසිම සැකයක් නෑ, පසුගිය සතියෙ වැන් ඕකන් අමතපු ලන්ඩන් රැස්වීමෙ හිටිය අයටත්, මෙහෙමම දැනෙන්න ඇති. මුලු ලෝකෙම කම්කරුවො එකම බෝට්ටුවෙ නේද ඉන්නෙ කියල අපි වගේම ඔවුනුත් හිතනව ඇති. පොදු වැඩ පිලිවෙලක් යටතේ ජාත්‍යන්තරව කම්කරුවො එකතු කල හැකි ය යන්න පිලිබඳව මට තියෙන්නෙ ශුභවාදී අදහසක්''.

කොලඹ රැස්වීම ආවරනය කිරීමට පැමිනි **මාධ්‍යවේදියෙකු** තම අදහස් පැවසුවේ මෙසේ ය: ''මගේ වෘත්තිමය ජීවිතයේ දී මේ වගේ ජාත්‍යන්තර රැ

ස්වීමක් රූප ගත කරන්න, පැමිනි පලමු අවස්ථාව මේ තමයි. ජාත්‍යන්තරය කියල කියන බොහෝ රැස්වීම් ආවරනය කරන්න මම ගියා වුනත්, ඒවායෙ හැම කථිකයෙක් ම කතා කරන්නෙ එක්කො ඔවුන්ගෙ රට වෙනුවෙන් නැත්නම් ඔවුන්ගෙ ආන්ඩු වෙනුවෙන්. කෙසේ නමුත් බිල් වැන් ඕකන් ඇමරිකාව වෙනුවෙන් කතා කරන්නෙ නෑ. එයා කතා කරන්නෙ කම්කරු පන්තිය වෙනුවෙන්. ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙනුවෙන්.

''බිල් වැන් ඕකන්ගෙ අනර්ඝ අදහස්වලට ඇදී ගිය මට, දේශනය පැවැත්වුනු කාලය තුල බොහෝ වාරයක් මගේ කාර්යය අමතක වුනා. මට වීඩියෝ කැමරාව හරියට මෙහෙයවන්න බැරි වුනා තෙපාව මත නියත කෝනයකට කැමරාව සවිකල මම දේශනය අහන්න ශාලාව තුල වාඩි වුනා. ඇමරිකානු සමාජය පිලිබඳව මාධ්‍ය මගින් පෙන්නපු චිත්‍රය මුලුමනින් වෙනස් එකක්. තැති ගන්වන සුලු කරුනු සහ සංඛ්‍යා ලේඛන සහිතව ඇමරිකාව තුල නියම දේශපාලනික, ආර්ථික සහ සමාජයීය තත්වය විශ්ලේෂනය කරන විද්‍යාත්මක ආකාරය ඇත්ත වසයෙන්ම මම අගය කරනවා. ලංකාවෙ පැවත්වෙන අනෙක් රැස්වීම්වල දී සාමාන්‍යයෙන් කෙරෙන්නෙ එකිනෙකාට දෝෂාරෝපනය කර ගැනීම් විතරයි. ඒවා කිසිම විද්‍යාත්මක ප්‍රවිශ්ඨයකින් තොර හිස් තර්ක. ඔව්, මෙය ඇත්ත වසයෙන්ම ජාත්‍යන්තරයි.''

මාතර සිට පැමිනි වෘත්තිය ඡායාරූප ශිල්පියකු වන **සුනිල්**, ඉංග්‍රිසියෙන් පැවැත්වුනු දේශනය සිංහල ට හා දෙමලට පරිවර්තනය කිරීමේදී වැය වූ දීර්ඝ කාලය නොතකා, ශ්‍රාවකයන් ඉවසිලි සහගතව දේශනයට සවන් දුන් ආකාරය සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙසේ පැවසී යː ''පැය හතරක දේශනයකට මේ තරම් අවධානයෙන් ඇහුම් කන් දීම මට නම් අදහන්නත් බෑ. නමුත් ශාලාව සිසාරා බැලු මට පෙනී ගියේ ඉතා බැරෑරුම්ව සවන් දෙන ශ්‍රාවකයක්.''

''මං හිතන විදියට, මේ අත්‍යසාමාන්‍ය අවධානයේ රහස බිල් වැන් ඕකන්ගෙ අදහස්වල බලය යි. ඔබ සත්‍යය ප්‍රකාශ කරන විට එය ඉතා බලගතුයි. වැන් ඕකන්, ඇමරිකාවෙ මිනිහෙක්, ඇමරිකාවෙ දේශීය හා විදේශීය පිලිවෙතට විරුද්ධව කරුනු කාරනා සහිතව කතා කරනවා. ඒක නියම වැඩක්. ඉරාකය තුල ඇමරිකාව සිදු කරන විනාශය සම්බන්ධයෙන් ඇමරිකානුවෙක් කතා කරන කොට ඒක හදවතට දැනෙනවා වගේම සිතුවිලි අවදි කරනවා.''

පුද්ගලීකරනයට එරෙහිව අරගලයක යෙදී සිටින ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කම්කරුවන්ගේ **වෘත්තීය සමිති ශාඛා නායකයකු** ද තම අදහස් දැක්වීය. ඔහුගේ වෘත්තීය සමිතිය, පාලක එක්සත් ජනතා නිදහස් සන්ධාන ආන්ඩුවේ කොටසක්වන සහ සිංහල ස්වෝත්තමවාදයේ සහ ජනප්‍රියවාදී පූර්වාතම්වල සම්මිශ්‍රනයක් මත පදනම් වූ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) මගින් පාලනය වන්නකි.

''ඉරාක ආක්‍රමනය සම්බන්ධයෙන් ජවිපෙ මුලුමනින්ම නිශ්ශබ්ද ඇයි කියල දේශනයෙන් මම තේරුම් ගත්ත. ඔවුන් අධිරාජ්‍යවාදී බලයන් ට, විශේෂයෙන්ම ඇමරිකාවට, හිස නමනව. දැන් ඔවුන්ගෙ ආන්ඩුව යටතෙ ලංකාවෙ හමුදා, ඇමරිකානු හමුදා එක්ක ඒකාබද්ධ අභ්‍යාසවල යෙදෙනව. ඔවුන් එල්ටීටීඊය ට විරුද්ධව ඇමරිකාවෙ සහාය ගන්න බලාපොරොත්තු වෙනව. වැන් ඕකන් කිව්ව වගේ, මේ භූගෝලීය යුගයෙ, ජාතිකවාදී වැඩ පිලිවෙලක් යටතෙ කවර හෝ සංවිධානයකට ඉදිරියට යන්න බෑ. ජවිපෙට වෙලා තියෙන්නෙත් ඒක තමයි''.

ශුභ සාධන නිලධාරියකු වන **සම්පත් පෙරේරා** මෙසේ විස්තර කලේ යː ''මම දැනගෙන හිටියෙ ඇමරිකානු ජනාධිපතිවරනයෙදි ඉදිරිපත්වෙලා ඉන්නෙ අපේක්ෂකයො දෙන්නෙක් විතරයි කියල - බුෂ් සහ කෙරී. මේ දෙන්න එකම කාසියෙ දෙපැත්ත. ඔබේ උද්ඝෝෂනය හරහා දැන් අපි දන්නව තවත් අපේක්ෂකයො ඉන්න බව විශේෂයෙන්ම සමාජවාදියෙක් මෙය ඉතා වැදගත්.

''ඇත්තටම ලෝක තත්වය ජාත්‍යන්තරීකරනය වෙමින් පවතින්නෙ. ඉරාක යුද්ධය ජාත්‍යන්තර ප්‍රශ්නයක්. ඇමරිකාව මුලු ලොව පුරා තමාගෙ ආධිපත්‍යය පිහිටුවන්න යන්නෙ. ඉරාක ආක්‍රමනය ඔවුන්ගෙ විජිතවාදී ව්‍යවසායෙ පලමු පියවර. ඒ අර්ථයෙන් ගත්තම, මෙය පරාජය කරන්න නම්, ජාත්‍යන්තර සමාජවාදයේ පදනම මත ජාත්‍යන්තර ව්‍යාපාරයක් සංවිධානය කරන්න ඕන. මේක තමයි මම මේ දේශනයෙන් උකහා ගත්තෙ.''

**ඒ. පෙරේරා** මෙසේ පැවසී යː ''අද මම ඇමරිකාව පිලිබඳව ජීවමාන අත්දැකීමක් ලැබුව. ඉස්සර මම හිතුවෙ ඇමරිකාවෙ කම්කරු පන්තිය වරප්‍රසාදිත සහ සුඛෝපභෝගී ජීවිත ගත කරනව කියල. බිල් වැන් ඕකන් මේ චිත්‍රය සුනු විසුනු කරල, තම රැකියා, සමාජ කොන්දේසි හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අහිමිවන ඇමරිකානු කම්කරු පන්තිය මුහුන දෙන සැබෑ තත්වයන් නියෝජනය කරන නව චිත්‍රයක් අප ඉදිරියේ නිර්මානය කලා. දැන් අපි දන්නව ලෝකය පුරා කම්කරුවො මුහුන දෙන්නෙ එකම ප්‍රශ්නවලට බව.''

කලා විෂයයන් හදාරන ශිෂ්‍යාවක වන **සහාෂිනී** තම අදහස් ප්‍රකාශ කලේ මෙසේ යː ''මේ රැස්වීමෙන් ඇමරිකානු දේශපාලන තත්වය සහ ඉරාක යුද්ධය පිලිබඳ නියම අදහසක් මට ලැබුනා. ඇමරිකාවේ ස්ථාපිත ද්වි-පක්ෂ ක්‍රමයට එරෙහිව වෙනත් අදහස් තිබෙන බැව් පලමුවතාවට දැනගත්තෙ අද තමයි. නමුත් තම අදහස් ප්‍රසිද්ධ කරන්න ඉඩ ලැබිල තියෙන්නෙ මේ පක්ෂ දෙකට (ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන්) විතරයි. අනෙක් පක්ෂවලට මේ අවස්ථාව නෑ. මේක හරි අසාධාරනයි. ඒක වෙනස් කරන්න ඕන.

''ඇමරිකානු කම්කරු පන්තිය සහ ලෝක කම්කරු

පන්තිය එකමුතු කිරීමේ සසප වැඩ පිලිවෙල ඉතා වැදගත්. ඇමරිකානු ආක්‍රමනය නිසා, ඉරාකය තුල අහිංසක මිනිස්සු බොහෝමයක් මිය යනවා. මුලු ලෝකෙම මිනිස්සු, ඉරාකයෙන් විදේශ හමුදා ඉවත් කිරීම සඳහා සටන් කල යුතුය කියන සසප අදහසට මම එකඟයි. සමානතාවය ඇති කිරීම සඳහා සියලු පීඩිත මහජනතාවන්, තම පාලකයන්ට එරෙහිව සටන් කිරීම සඳහා එකමුතු විය යුතු යි.''

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිරතුරුව කියවන මුද්‍රන කම්කරුවෙකු වන **දන්කොටුවගේ** අදහස් මෙසේ ය: ''මම මේ රැස්වීමට ආවේ ඉරාක යුද්ධයට විරුද්ධ නිසා. මේ රැස්වීමෙන් මම ඉගෙන ගත්ත එක්සත් ජනපද ජනාධිපතිවරනයේ දී ඩිමොක්‍රටික් පක්ෂයේ භූමිකාව. කෙරී කියනව යුද්ධය වඩාත් කාර්යක්ෂමව සංවිධානය කරන්න ඕන කියල. බුෂ්ගෙ හා කෙරීගෙ වෙනසක් නෑ.

''ලෝක ආර්ථිකය පාලනය කරන්නෙ මහ ව්‍යාපාරිකයො අතලොස්සක් විසින්. ලොව පුරා කම්කරුවන්ගෙ රැකියා අහිමි වෙමින් පවතිනව. ඉරාක යුද්දෙ ප්‍රතිඵලයක් හැටියට තෙල් මිල ඉහල යනවා. ශ්‍රී ලංකාව වගේ ඌන සංවර්ධිත රටවලට මෙය වැඩියෙන් බලපානව. මේ ලාභ පද්ධතිය අහෝසි කරන්න ඕනෙ. එහෙම කලොත් විතරයි මහජනතාවට තමාගෙ අයිතීන් දිනන්න පුලුවන්.''

ඇඟලුම් කම්කරුවකු වන **නුවන්**: ''ඇමරිකානු ජනාධිපතිවරනයේ දී පීඩිත මහජනතාව නියෝජනය කරන අපේක්ෂකයකු සිටින බව දැන ගන්න ලැබීම සතුටක්. ශ්‍රී ලංකාව තුල සියලුම මාධ්‍යයන් නියම තත්වය වහංගු කරනවා. ඒ නිසා මම හිතනවා නියම තත්වය ප්‍රසිද්ධ කරන්න මේ රැස්වීම ඉතා වැදගත් කියල.

''මේ ඉරාක යුද්ධයට මම විරුද්ධයි. ලෝකෙ වෙන දේවල් ශ්‍රී ලංකාවෙ සියලුම මාධ්‍යවලින් වහංගු කෙරෙනවා. ධනපති පන්තිය තමයි මේ මාධ්‍ය පාලනය කරන්නෙ. සිදුවෙන දෙය හෙලිදරව් කිරීම සඳහා ඔබේ පක්ෂය ඉතා වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කරනව කියල මට හිතෙනවා. සසප පිලිවෙත් ගැන මම බොහොමයක් දන්නෙ නෑ. නමුත් එය අධ්‍යයනය කිරීමට අවශ්‍යයි''.

සිලෝන් ඔක්සිජන් සමාගමේ **කම්කරුවකු** මෙසේ පැවසීය: ''මේ රටට, ඇමරිකාවට සහ ලෝකෙට වුනේ මොකක් ද කියල අවබෝධ කර ගන්න එක ඉතා වැදගත්. මේ දේශනයෙන් යුද්ධය හා ඇමරිකාවෙ තත්වය පිලිබඳ බොහෝ දේ මම දැන ගත්තා. ඉරාක යුද්ධය තෙල් සඳහා යුද්ධයක් සහ දාමරිකත්වයේ යුද්ධයක්. මගේ වැඩ පොලේ හැම දෙනාම මේ යුද්ධයට විරුද්ධයි.

''මේ යුද්දෙ නතර කරන්න පුලුවන් කම්කරු පන්තිය ජාත්‍යන්තරව එකමුතු කිරීමෙන් පමනයි. මේ රැස්වීමට කම්කරුවන්, තරුනයින්, සහ බුද්ධිමතුන් පැමින සිටීම එවැනි ව්‍යාපාරයක් ගොඩ නැගිය හැකි බව පෙන්වන හොඳ සංකේතයක්. ඇමරිකාව තුලත්, ලංකාව තුලත්, අනෙකුත් රටවල් තුලත් විප්ලවයක් සිදුවිය යුතුයි. ශ්‍රී ලංකාව තුල ධනපති සහ සුලු ධනේශ්වර පක්ෂ කිහිපයක් තිබෙනවා. නමුත් අපි සැබෑ වමේ පක්ෂයක් ගොඩ නැගියයුතු යි.''

මාස දෙකකට පෙර සසපට හලාවතදී හමු වී, රැස්වීමට සහභාගි වූ පාසල් ශිෂ්‍යයකු වන **ශ්‍රී කාන්ත්**ගේ අදහස් මෙසේ ය: ''ඇමරිකානු මැතිවරනය ලොව පුරා බලපෑමක් ඇති කරනව. ලංකාව ඇතුලු අනෙකුත් රටවල්වල ආන්ඩු වැඩ කරන්නෙ ඇමරිකානු පරිපාලනය ගන්න තීන්දු මත. මේ අතරතුර ශ්‍රී ලංකාව ගැඹුරුවන ආර්ථික අර්බුදයකට මුහුන දීල ඉන්නෙ. මම මෙහේ ආවේ, සමාජවාදයෙන් මේ ගැටලු සඳහා ඉදිරිපත් කරන විසඳුම මොකක්ද කියල හොයන්න.

''අපි හිතුවෙ දුප්පත් මිනිස්සුන්ගෙ සංඛ්‍යාව වැඩි වන්නෙ ඌන සංවර්ධිත රටවල පමනක් කියල. නමුත් දැන් අපිට අවබෝධ වෙනව, ඇමරිකාවෙ ධනයෙන් ලොකුම කොටසක් අතලොස්සක් අතට යන අතරෙ මහජනතාවගෙන් බහුතරය දරිද්‍රතාවයෙන් දුක් විඳින බව.

''දේශපාලනය ගැන කතා කරන කොට අපේ පාසල් සගයන් ගෙන් සමහරු අපිට විහිලු කරනව. නමුත් අපි දිගටම ගැඹුරු ප්‍රශ්න තිබෙන බව ඔවුනට පැහැදිලි කරනව. අපේ අධ්‍යාපනය හමාර කලත් අපිට කිසිම අනාගතයක් නෑ. ධනවාදයේ ආධිපත්‍යය නිසා අනාගතය සම්බන්ධයෙන් අපිට කිසිම අවස්ථාවක් නෑ.

''අවුරුදු 50ක් තිස්සේ ලංකාව පක්ෂ දෙකක් මගින් පාලනය කෙරෙනව. පක්ෂ දෙකම කරන්නෙ එකම දේ. ඔවුන් ධනපති අතලොස්සෙ අවශ්‍යතා සපුරනව. ජනතාවගෙන් බහුතරයකට මොකුත් ලැබෙන්නෙ නෑ. දැන් මම විශ්වාස කරන්නෙ ජනතාවගෙන් බහුතරයකගෙ අවශ්‍යතා සපුරා ගන්න පුලුවන් වෙන්නෙ සමාජවාදය ගොඩනැගීමෙන් පමනක්මයි කියල.''

පේරාදෙනිය සරසවියෙ පලමු වසර කලා විෂය ධාරාව හදාරන ශිෂ්‍යයකු වන **බී. සිවාකරම්** මෙසේ පැහැදිලි කලේ ය: ''ඉරාකයේ හිටපු ජනාධිපති සදාම් හුසේන් තමාගේ ම රටේ ජනතාවට කරන ලද අපරාධ සම්බන්ධයෙන් ඔහුට මරන දඬුවම ලබා දිය යුතු යැයි, ඇමරිකාව පැවසුවා. ඇත්ත වසයෙන්ම ඔහු සාහසික අපරාධ කලා තමයි. ඒත් මේ සාහසික යුද්ධය තුලින් ඇමරිකාව මුලු මහත් රටම විනාශ කරමින් සිටිනවා.

''භූගෝලීයකරනය යටතේ, ඇමරිකානු සංගත පසුගාමී රටවල ලාභ ශ්‍රමය සහ සම්පත් සූරාකන අතර, ඇමරිකානු හමුදාව ඉරාකය වගේ රටවල් අල්ලා ගනු ලබනවා. ඇමරිකාව තම යුද අවශ්‍යතාවන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය තුල තමාට ඇති නිෂේධ බලය යොදා ගනු ලබනවා. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී රටකට කිසිදිනෙක නිෂේධ බලයක් අවශ්‍ය නෑ.''

තම පියා විසින් නිවෙසට රැගෙන එන ලද පත්‍රිකාවක් කියවා කොලඹ රැස්වීමට සහභාගි වූ දහසය වියැති ශිෂ්‍යයකු වූ **අදීශ පෙරේරා** මෙසේ පැවසීය:

‘‘අපිට කියල තිබුනෙ ඇමරිකාව හොඳ රටක් කියල. නමුත් ඇමරිකාව කියන්නෙ ද්වි-පක්ෂ ඒකාධිකාරයක් කියල බිල් වෑන් ඕකන් පැහැදිලි කලා. පාලකයො වැඩ කරන්නෙ මහජනතාවගෙන් බහුතරයක අදහස් උඩ නොවෙයි. එහේ තියෙන්නෙ මහ ධනවතුන්ගෙ පාලනයක්. ඒක හරියට ධනපති පක්ෂ දෙකකින් පාලනය වන ශ්‍රී ලංකාව වගේ.’’

සීඑන්එන් රූපවාහිනී චැනලයන් හරහා ලෝක සිද්ධීන් සමීපව අධ්‍යයනය කරන බව පැවසූ පෙරේරා, ‘‘මෑතකදී මම උනන්දුවක් දැක්වූවා, බුෂ්-කෙරී විවාදයට සහ ඉරාක යුද්ධය ඇතුලු අනෙකුත් එක්සත් ජනපද මැදිහත් වීම්වලට. ඔවුන් එකිනෙකාට මඩ ගසා ගැනීමේ සහ ඉරාක යුද්ධය සාධාරනීකරනයේ යෙදී සිටියා. ඉරාක යුද්ධයට ඡන්දෙ දීපු කෙරී දැන් යුද්ධය විවේචනය කරනවා.

‘‘ලෝක ජනගහනයෙන් සියයට 80ක්, ලෝක දල ජාතික නිෂ්පාදනයෙන් භුක්ති විඳින්නෙ සියයට 14ක් පමනයි - ලෝක ජනගහනයෙන් අඩකට වඩා සිටින්නෙ දරිද්‍රතාවෙ. මේ තත්වය තුල ලොව සුපිරි බලය විසින් ගනු ලබන සෑම පියවරක් ම සමස්ත ලෝකය කෙරෙහිම බලපානව. ඒවා ශ්‍රී ලංකාව තුල ප්‍රශ්නවලටත් බලපාන්න පුලුවන්. ඇමරිකාවෙ ධනපති පක්ෂ උදව් කරන්නෙ මෙහේ ධනපති පක්ෂවලට පමනයි. ලොව පුරා පාලනය කරන්නෙ ධනපති පක්ෂ.’’■

© www.wsws.org